

# නොබිඳුණු අධිෂ්ඨානය

හිරණ්‍යා සත්සරණි දිසානායක

# නොබිඳුණු අධිෂ්ඨානය

හිරණ්‍යා සත්සරණී දිසානායක
කර්තෘ


කර්තෘගේ සියලු කෘති

*සාගරී සහ තවත් කතා
*අපූරු මිතුරෝ
*මගේ පුංචි නංගියා
*සිව් මිතුරියෝ
*නොබිඳුණු අධිෂ්ඨානය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර
12 - E විද්‍යා අංශය

# පිදුම

"පොළොවේ පය ගසා ජීවත් වෙන්න කියාදෙන අතරතුරම,
තරු අතර පියඹා යන්නට මට නිදහස දුන් මගේ ආදරණීය
තාත්තාට...
සහ
"කාලය සහ අවකාශය ඉක්මවා යන සිතුවිලි වෙනුවෙන් සහ,
නොදන්නා විශ්වයේ රහස් සොයා යන්නට පෙළඹෙන සියලුම
කුතුහලයෙන් පිරි මනස් වෙනුවෙන්...""





# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදූ කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහු විධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පති
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# හැඳින්වීම

සීටන් කියන ගමේ ජීවත් වන ගම්වැසියන්ගෙන් සුළුතරයක් රැකියාව විදියට කරන්නේ මුහුද ගැඹුරට පිහිනලා ගිහින් මාලු වර්ග, මුහුදු පැළෑටි වගේ දේවල් එකතු කිරීම. ඒත් මේ ගමේ ගොඩාක් කල් ඉඳලා, ඒ කියන්නේ පාරම්පරිකව ජීවත්වෙන ගම්වැසියෝ තමන්ගේ රැකියාව විදිහට කරන්නේ ඉතාමත් සුවිශේෂී දෙයක්. එය තමයි කාටවත් පහසුවෙන් ළං වෙන්න බැරි, මුහුදේ ගැඹුරුම ප්රදේශවල තියෙන ඛනිජ ගුහාවලින් සුවිශේෂී ඛනිජ එකතු කිරිම. ඉතින් මේ කාර්යයට ගැලපෙන විදිහට වාතය ගොඩක් වෙලා රඳවාගෙන ඉන්න පුළුවන් පෙනහලුත් මේ පිරිසට පාරම්පරික උරුමයක් විදියට ලැබිලා තියෙනවා. ඒ වගේම කුමන රැකියාව සිදු කලත් පරිසරය ආරක්ෂා කිරීමට ගම්වැසියන් සියලු දෙනා වග බලා ගත්තා. මේ රැකියා තුනෙන් මොන රැකියාව කරත් ගමේ පිරිස ඉතාමත් සමගියෙන් ජීවත් වුණා. මොකද මේ වගේ භයානක රැකියාවක් කරද්දී හැමෝගෙම එකමුතුකම ගොඩක් වැදගත්.

මේ ගමේ වැසියන්ගේ බොහෝ කාලයක ඉඳන්ම පීඩා විඳින ගැටලුවක්ම තමයි ඔවුන් ජීවත්වන භූමිය සාරවත් නොවීම. මේ ගම්වැසියන්ට සාගරයෙන් ආහාර එකතු කරන්න වෙන ප්රධානතම හේතුවත් භූමියේ කිසිවක් වගා කිරීමට නොහැකි වීම. ඉතින් ගොඩබිමෙන් ලබාගන්න ඕනේ සමහර පෝෂක වර්ග සහිත ආහාරයන් මේ ගමේ වැසියන්ට ලබාගන්නට නොහැකි වීම නිසා එක අවුරුද්දකට අලුත උපන් දරුවෝ විශාල පිරිසක් මිය යනවා වගේම වැඩිහිටි පුද්ගලයින් පවා ගොඩක් ලෙඩ වෙනවා.

රිකාඩෝ කියන්නේ මේ ගමේ ජීවත් වෙන ශක්තිමත් බුද්ධිමත් සහ ජවසම්පන්න ගෝත්‍රික තරුණයෙක්. ඔහු තමයි පවුලේ එකම දරුවා. දැන් තරමක් වයෝවෘද්ධ වෙලා ඉන්න තමන්ගේ මව රැකබලා ගැනීමේ වගකීම පැවරිලා තියෙන්නේත් ඔහුටම තමයි. ඉතින් මෙයාටත් අර පාරම්පරික ජානමය ලක්ෂණය උප්පත්තියම වගේ ලැබිලා තියෙනවා. මේ ගමේ තියෙන තවත් සම්ප්‍රදායක් තමා යම්කිසි තරුණයකුට තමන් තෝරා ගත්ත රැකියාව සිදු කිරීමට අවුරුදු විස්ස සම්පූර්ණ විය යුතුයි. ඊට පස්සේ ඔහුට තම ජීවන වෘත්තිය කැමති නම් වයෝවෘද්ධ වෙනතාක්ම සිදුකළ හැකිය. ඉතින් රිකාඩෝට වයස අවුරුදු විස්ස සම්පූර්ණ වන්නේ හෙට දිනයේ යි. ඔහු ඔහුගේ ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්තේ ගැඹුරු මුහුදේ ඇති ඛනිජ කැණීම සිදුකිරීමයි. ඔහු දැන් ඔහුගේ වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට නොඉවසිලිවත්ම බලා සිටින්නේ හෙට දිනය උදාවන තුරුයි. මෙතෙක් කාලයක් මිතුරන් සමඟ සෙල්ලමට පමණක් ගැඹුරු මුහුදෙ කිමිදුණු ඔහු, හෙට දින සිට රැකියාව වශයෙන් එම කාර්යය සිදු කළ යුතුය.



<u>මෙම කතාවෙන් දිගහැරෙන්නේ රිකාඩෝ තම ජීවිතයේ මුහුණ දුන් ත්‍රාස්යජනක ම අත්දැකීමයි.</u>

රිකාඩෝ පුන පුනා බලා සිටි ඒ සුවිශේෂී දිනය උදාවිය. එහෙත් උදෑසනම ඔහුගේ දෙසවනට වැටුනේ කුතුහලය දනවන  ආරංචියකි. එනම් ගම් නායකයා විසින් සුවිශේෂී කරුණක් දැන්වීම සඳහා රැස්වීමක් පවත්වන්නට නියමිත බව ය. එම නිසා රිකාඩෝ ද ඉක්මනින් ගමේ රැස්වීම් පවත්වන විශාල මිදුල දෙසට පියමැන්නේය.
බිම වැලි අතුරා සකස් කර තිබූ රවුම් මණ්ඩපයක් වැනි එම මිදුල අසලට යන විටත් ඔහුට දැක ගැනීමට හැකිවූයේ ගම් වැසියන් විශාල පිරිසක් එම ස්ථානයට රැස්වී  ඇති බවයි. මෙම මිදුල මැද ඇති තවත් කුඩා උස් මණ්ඩපයක් වැනි කොටස මත සිටගත් ගම් නායකයා මෙසේ පැවසුවේය.



"මම අද මේ රැස්වීම තියන්න හිතුවේ, මම අද කියන්න යන කාරණය අපේ ජීවිත වලට ගොඩාක් වැදගත් වෙන නිසා." ඒ ගමේ නායකයාගේ කටහඬයි. අත්දැකීම් බහුල දැනුම් තේරුම් ඇති වැඩිහිටියෙකු වූ ඔහුව ගමේ නායකයා බවට පත් කරන ලද්දේ ද  ගම් වැසියන් විසින්මයි.

"ඔයාලා හැමෝම දන්නවා අපේ ගමේ ගම්වැසියන් සියලු දෙනාගේ ජීවිතය  තීරණය කරන්නේ මේ මහා මුහුද. ඒත් මට හිතෙන විදිහට අපි ගොඩ දෙනෙක්ගේ ජීවන කර්මාන්තය වෙන සාගර පතුලේ තියෙන ඛනිජ කැනීම අපිට තවදුරටත් සිදුකරගෙන යාමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මොකද ගිය සතියේ ඛනිජ කැණීම සිදුකරන්න ගියපු අපේ ගම්වැසියන්ගෙන් ලැබුණු ආරංචිවලට අනුව මුහුදු පතුලේ අපිට ලං වෙන්න පුළුවන් උපරිම සීමාවට එනකන් තියෙන සියලුම වටිනා ඛණිජවර්ග කැණීම සිදුකරලා අවසානයි. ඒ කියන්නේ අපිට ආයේ ඛනිජ කෑණීම සිදුකරන්න බැරිවෙයි."

මෙම ප්‍රකාශය සිදුකළ පසු ගම් නායකයා රැස්ව සිට පිරිස දෙස බැලූ අතර ඒ සියලූම දෙනාගේ මුහුණු ශෝකයෙන් හරිත වී තිබුණේ "තම අසුභ කාලය උදා  වීමට නියමිත බව ප්‍රකාශ කරන්නාක් මෙනි"

ගම් නායකයාගේ මෙම වදන් ඇසූ රිකාඩෝටද තම සිත තුළ අකුණක් ගසනවා වැනි හැඟීමක් ඇති විය. මන්ද, ඔහු තම වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට සැරසුණු ප්‍රථම දිනයේම මෙවැනි දෙයක් ඇසීමට සිදුවීම නිසයි.

තවත් සුළු සුළු කාරණා කිහිපයක් සාකච්ඡා කිරීමෙන් අනතුරුව රැස්වීම අවසන් වූ අතර බලාපොරොත්තු විරහිත වූ රිකාඩෝ ශෝකයෙන් නිවස කරා පියමැන්නේය.

"අම්මේ, බලන්න. මම මගේ රැකියාව පටන් ගන්න හදපු මුල්ම දවසේම ඒක මට නැති වෙන්නයි යන්නේ.

මේ ගමට ඛනිජ නැතිවෙනවා කියන්නේ ගමේ දියුණුව සම්පූර්ණයෙන්ම අඩාල වෙනවා කියන එක නේද.මම කැමති නැහැ මගේ ගමේ අයට එහෙම වෙනවා දකින්න. මම අදම යනවා මුහුදට ගිහින් වටිනා ඛනිජයක් හොයාගෙන එනවා. ඒකෙන් පුළුවන් වෙයි අපේ මුළු ගමම සශ්‍රීක කරන්න." මෙසේ කියා තම මව දෙස දෑස් දල්වා බැලූ රිකාඩෝ දුටුවේ තම මවගේ දෑස් වලින් කඳුළු බිංදු වැටෙන ආකාරයයි. ඒ කඳුළු බිංදු දුකක් නිසා හටගත් ඒවා නොව තම පුත්‍රයාගේ නිර්භීතකම නිසා මවගේ ඇසෙහි නැගුණු කඳුළු බිංදුය.

" මම දන්නවා මගේ පුතා ඕනෙම අභියෝගයක් ජය ගන්න පුළුවන් නිර්භීත තරුණයෙක් බව "මෙසේ පැවසූ රිකාඩෝගේ මව ඔහුව තුරුලු කරගෙන තම ආදරය දැක්වූවාය.ඔහුගේ මේ නික්මයාම ගමේ කිසිවෙකුටත් නොපැවසීමට රිකාඩෝ වග බලා ගත් අතර එසේ සිදු කළහොත් කවුරු හෝ ඔහුගේ ගමන නවත්වාවියැයි ඔහුට දැනුන සැකය නිසාය.
ඔහු විසින්ම සාදාගත් කුඩා ඔරුවක නැගුණු රිකාඩෝ ඈත දියඹ කරා ගමන් කළේය.



රිකාඩෝ තමා කුඩා කල සිට උගත් දේ අනුව සාගරයේ එක් එක් මසුන් විශේෂ වසන ප්‍රදේශයන්, එක් එක් ඛනිජ වර්ග පිළිබඳව සහ ස්වභාව ධර්මය පිළිබඳ ව කරුණු රැසක් දැන සිටියේය. ඒවා පිළිබඳ ඔහුගේ දැනුම ඇතැම් විට විට ගමේ දැන උගත් වැඩිහිටියෙකුගේ දැනුමට සමාන වූයේ ඔහු ස්වභාවධර්මයට දැක්වූ අසීමිත ඇල්ම නිසාමය.

මුහුදේ යම්කිසි දුරකට පැමිණි ඔහු, ඔහු සතුව ජලය තුළ වූ පීඩනයෙන් ආරක්ෂා වීමට ඔහුගේ කන්වලට සුවිශේෂී ශාක කොටස්ද සවි කරගෙන, කැණීම් ආම්පන්නයද රැගෙන මුහුදට පැන්නේ, තමා වාසය කරන ගම්මානය කෙසේ හෝ සමෘද්ධිමත් කරනවා යන හැඟීම සිත තුළ තබා ගෙනය.

සාමාන්‍ය පුද්ගලයන්ට මුහුදේ ගැඹුරට පිහිනෙන විටදී ඇතිවිය හැකි කුඩා බියක් පවා රිකාඩෝට ඇති නොවූයේ ඔහුට මුහුද ද ඔහුගේ වාස භූමිය හා සමාන වන බැවිනි. ඔහුට ඔහුගේ පාරම්පරික උරුමයෙන් ලැබුණු ආශ්වාස වාතය තම සිරුර තුළ වැඩි කාලයක් රඳවා ගැනීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් ඔහු මුහුදේ අසිරිය ද නරඹමින් ඔහුගේ එකම ඉලක්කය වූ ඛනිජ පතල සොයා කිමිදුනේය.



ටික දුරක් යන විට ඔහුට කොරල් පර සහ විවිධ පාෂාණ විශේෂ වලින් සැකසුණු ගුහාවක් දැකගැනීමට හැකි විය. ඒ ඔහු ඉදිරියේ තිබෙන්නේ ඔහුගේ මුතුන් මිත්තන් පවා ඔවුන්ගේ ජීවිතය රැක ගැනීමට අවශ්‍ය පාෂාණ ආශ්‍රිත ඖෂධ සහ වටිනා ඛනිජ වර්ග රැස්කරගත් විශාල කනිජ පතල බව වැටහෙන්නට ඔහුට ක්ෂණයක්වත් ගත නොවීය. ඔහු මුහුද පතුලට කිමිදුනාටත් වඩා වේගයෙන් එම ඛනිජ පතල දෙසට පිහිනා ගියේ තම අනාගතය පිළිබඳව සිහින රැසක් මවමිනි.

ඛනිජ පතලේ ද්වාරය ළඟට ලංවූ ඔහුට දැක ගැනීමට ලැබුණේ ද්වාරය ආරම්භයේ සිට දෙපසට විහිදුණු උමං දෙකකි. රිකාඩෝ මෙයින් තෝරා ගත්තේ මදක් වැඩියෙන් ජලජ ශාක වර්ධනය වී තිබූ මඟයි. එම උමගෙහි ඇතුළත ඇති පසෙහි සහ පාෂාණවල සංයුතිය අනෙක් පස ඇති උමගෙහි තිබෙන පස හා පාෂාණවල සංයුතියට වඩා බෙහෙවින් වෙනස් බව ඔහුට වැටහිණි. ඔහු ගමේ දී අසා ඇති පරිදි එම උමග ගම්වැසියන් වැඩිපුර භාවිතයට නොගන්නේ එය අනෙක් උමගට වඩා බොහෝ සෙයින් දිගින් වැඩි නිසායි.



දැනටමත් අඩි හැත්තෑවකට අධික දුරක් සාගරය තුළට කිමිදුණු ඔහු ආශ්වාස වාතය ශරීරය තුළ තබා ගනිමින් මිනිත්තු දෙකකටකට ආසන්න කාලයක් සාගරය තුළ ගතකර ඇත. එම නිසා ඔහුට ආපසු ගොඩබිමට යාමටත් මිනිත්තු දෙකකට ආසන්න වේලාවක් ගතවේ. ඔහු තමාට උපරිම මිනිත්තු විස්සක පමණ කාලයක් ආශ්වාස වාතය ශරීරය තුළ තබාගෙන ජලය තුළ සිටිය හැකි බව අත්දැකීමෙන් දන්නේය. එබැවින් රිකාඩෝට උපරිම මිනිත්තු 16 පමණක් මුහුදේ ඛනිජ සෙවීම සිදුකළ හැකිය, ඛනිජ සෙවීමට වැඩියෙන් ජලජ පැළෑටි වැඩී තිබූ උමග තෝරා ගැනීමට හේතුව එම උමග වැඩිපුර මිනිස් පරිභෝජනයකට ලක් නොවූ නිසා එහි තුල වටිනා කනිජ සම්පත් තිබිය හැකි වේ යැයි ඔහු තුළ විශ්වාසයක් ඇති වීමය. ඔහු තම ජීවිතය ද පරදුවට තබමින් එම උමග තුළට පිවිසියේ තම අරමුණ සැබෑවක් කර ගැනීමේ අධිෂ්ඨානයෙනි.

මිනිත්තු දෙකක පමණ කාලයක් එම උමග තුළට ගමන් කළ ඔහුට එහිදී ම මුහුණ දීමට සිදුවූ කරදරකාරී සිදුවීම වූයේ එම උමග තුළ අනෙක් උමගට වඩා මසුන් වැඩි ප්‍රමාණයක් ජීවත් වීමය. එබැවින් ඔහුට උමගේ ඉදිරියට ගමන් කිරීම දුෂ්කර විය. අනෙක් උමගෙහි ආරම්භක ද්වාරය අසල සිට බැලූ විට මෙම උමගේ ආරම්භක ද්වාරය අසල සිටි මසුන් ප්‍රමාණයෙන් තුනෙන් එකකටත් වඩා අඩු ප්‍රමාණයක් සිටි අතර එය රිකාඩෝට විශ්මය දනවන කාරණාවක් විය. ඔහුට සිතුනේ මෙම උමගෙහි ජලජ පැළෑටි වැඩි නිසා, එය මසුන් විශාල ප්‍රමාණයක් ජීවත් වීමට හේතුව විය හැකි බවයි.කෙසේ හෝ එම අභියෝගයද මැඩගනිමින් තවත් මිනිත්තු දෙකක පමණ කාලයක් ගමන් කළ ඔහුට දැක ගැනීමට හැකි වූයේ නැවතත් එම උමග දෙපසට බෙදී ඇති බවයි.



මෙම දෙකට බෙදුණු උමගෙහි දකුණු පස ඇති කොටසෙහි මාළුවන් වැඩි වශයෙන් ගැවසුණු අතර වායු බුබුළු වැඩි ප්‍රමාණයක් ද ඇති බව ඔහුට පෙනිණි. එමෙන්ම අනෙක් පස ඇති උමං කොටස මදක් අඳුර වූ අතර එහි අන්ත කෙළවරෙහි යම්කිසි එළියක් ඇති බව ඔහුට පෙනුණි.

ඔහු සිතුවේ එම එළිය ගුහාවෙන් බාහිරට විවෘත වී ඇති ද්වාරයක් නිසා ඇතිවූ එළියක් බවයි. එම නිසා ඔහු වැඩි මත්සයින් සිටින උමග තුළට යාමට තීරණය කළේය.

මෙම මාර්ගයේ බොහෝ තැන්වල පාෂාණ කුට්ටි දක්නට ලැබුණු අතර එම පාෂාණ අතර වූ සිදුරු තුළින් වාත බුබුළු රාශියක් පැන නැගෙන අයුරු ඔහුට දක්නට ලැබිණි. ඔහු තවත් මිනිත්තු දෙකක පමණ කාලයක් ගමන් කරන විට මෙතෙක් වේලා එම ගුහාවේ තැනින් තැනින් වැටුණු ආලෝක ධාරා කෙමෙන් කෙමෙන් අඩුවන බව ඔහුට වැටහිණි.

එසේ ආලෝකය කෙමෙන් අඩු වන්නේ රාත්‍රී කාලය උදාවන නිසා නොව ගුහාවේ ඇතුලත ඉහළ පෘෂ්ඨයේ තිබූ කුඩා කුඩා සිදුරු කෙමෙන් කෙමෙන් අඩු වන නිසා බව ඔහුට වැටහිණි. තවත් ටික දුරක් යන විට ඔහුට දැක ගත හැකි වූයේ ඇස් අදහා ගත නොහැකි දෙයකි.

එම උමග අවසන් වන ස්ථානයේ, තමා කලින් දුටු ආකාරයේ නමුත් තරමක් විශාල පාෂාණ පැළුමක් තුළින් විශාල වාත බුබුළු සංඛ්‍යාවක් ඉහලට ගමන් කරන ආකාරයයි. එම ඉහළට ගමන් කරන වාත බුබුළු ස්වභාවිකව සෑදුණු ගුහාවේ ඉහළ පෘෂ්ඨයේ ඒකරාශී වී තනි විශාල වාත බුබුලක් සාදයි. සැලකිය යුතු විශාලත්වයකට එම වාත බුබුල පැමිණි විට එයින් කොටසක් ගුහාවේ ඉහළ පෘෂ්ඨයේ දිගේ පෘෂ්ඨය තරමක් උස්වන ස්ථානයකට පැමිණ එම ස්ථානයේ ඇති කුඩා සිදුරක් තුළින් ගුහාවෙන් ඉවතට ගමන් කරයි. ඒ අවට සිටින මත්සයින් අර වාත බුබුල අසලට ගොස්, වෙනත් මාළුවන් ජලයෙන් මතුපිටට පැමිණ වාතය ලබාගෙන නැවත ජලය තුළට ම යන අයුරින් මෙම වාත බුබුලෙන් වාතය ලබාගෙන නැවතත් පිහිනා යයි.



මෙවැනි සිදුවීමක් රිකාඩෝ තම ජීවිතයේ කිසිදාක දැක නැත. එබැවින් ඔහුට ඇත්තේ ඉතා විශ්මයකි. එහෙත් ඔහුට එම විශ්මය ඇතුළත කුඩා අපරාජිත හැඟීමක්ද දැනෙන්නට පටන් ගැනිණ. මන්ද, ඔහුට සොයා ගැනීමට අවශ්‍ය කරන්නේ මෙම විශ්මයජනක වාත බුබුල නොව, තම ජීවිතය මෙන්ම තම ගමේ ජනතාවගේද අනාගත ජීවිතේ විසඳිය හැකි වටිනා වූ ඛනිජයකි.

ඔහුට තවත් කණගාටුවට හේතුවක් ඇත. එනම් තමා තුළ රඳවාගෙන තිබෙන ආශ්වාස වාතයෙන් කොටසක් මෙවැනි සුන්දර නමුත් නිශ්ඵල දෙයක් නැරඹීමට යොදා ගැනීමට සිදුවීම පිළිබඳවයි. කෙසේ හෝ ඔහු නැවත වරක් දෙකට බෙදුණු උමං මාර්ගයේ ආරම්භයට පැමිණියේය. දැනට ඔහු ජලය තුළින් සම්පූර්ණ මිනිත්තු11පැමිණ ගත කර ඇති අතර ඔහු වම් පස තිබුණු උමග තුළට ගමන් කලේ ඉතා කණගාටුවෙන්ය. එම උමග තුළ මිනිත්තු තුනක් පමණ ගමන් කරන විට රිකාඩෝට වැටහී ගියේ එම උමගේ ඇතුළු පෘෂ්ඨයේ සංයුතිය ගුහාවෙහි වෙනත් ස්ථානවල සංයුතියට වඩා බෙහෙවින් වෙනස් බවය. එමෙන්ම ඒ තුළ වූ උෂ්ණත්වයද ගුහාවේ වෙනත් ස්ථානවලට වඩා තරමක් වැඩි විය.



තවද මෙම උමග තුළ මත්සයන් සහ ජලජ පැළෑටිද ඉතා අවම විය. මෙසේ ටික දුරක් එම උමග තුළට ගමන් කළ ඔහුට ගුහාවේ එක් කෙළවරකින් ඉතා දීප්තිමත් ආලෝකයක් ගුහාවේ තිබුණු අඳුර අතරින් ඔහු සිටින දෙසට පැමිණෙන අයුරු දැක ගන්නට ලැබිණි. ඔහු ඉතා වේගයෙන් ඒ දෙසට පිහිනා යන්නට විය.

මෙන්න, මෙතෙක් වේලා වේ ඔහු සොයමින් සිටි දෙය දැන් ඔහුගේ ඇස් ඉදිරිපිට ම ඇත. එය ඇලෝඩියා නම් වූ දම් පැහැ පාෂාණයකි. රිකාඩෝ දන්නා අයුරින් මෙම පාෂාණය කුඩු කර ලබාගන්නා කුඩු, මුහුදු ජලය සහ ගොඩබිම ඇති ගුරුගල් නම් පාෂාණ විශේෂය එකතුකර සාදන මිශ්රණය පොළොව මත ඉසීමෙන් එම පොළොව නැවත කිසිදාක නිසරු නොවන ආකාරයට සරු කළ හැක.

මෙම මොහොතේදී ඔහුගේ සිත වෙන කවරදාටත් වඩා සතුටින් පිරී ගිය අතර ඔහුට ඔහු ගැනම අභිමානයක් නිරායාසයෙන්ම ඇතිවූයේ තමන් මෙම පාෂාණය ගොඩබිමට රැගෙන ගියහොත් තම වාස භූමියම පණ ලබන නිසාවෙනි.

ඔහු ඉතා සන්තෝෂයෙන් යුතුව එම පාෂාණය කැණීම ආරම්භ කළේය. එය ගුහාවේ පොළොවට ඉතා තදින් සවි වී තිබූ අතර කැනීම ඉතා අපහසු විය. නමුත් ඔහු ඉතා උනන්දුවෙන් එය සිදු කළ අතර ඔහුට නොදැනීම ඔහු මුහුද යට මිනිත්තු දාහතක් පමණ සම්පූර්ණයෙන් මේ වනවිට ගත කර තිබිණි.

ඔහුට ඒ බව මතක් උනේ ඔහු හට කුඩා ස්වසන අපහසුතාවයක් ඇතිවෙද්දීය.



ඔහුට ඇති වූ සතුට ක්ෂණයකින් නැතිවුණේ ඔහුගේ හදවතට මරණ බිය දනවමින් ය.

"මට ඇතිවුණ සතුට නිසා මට මං ගැනම අමතක උනා. දැන් මම මොකද කරන්නේ" මේ ඔහුගේ හිතට පැමිණි වචන ය.

එහෙත් ඒ සමගම ඔහුගේ සිතට පැමිණියේ ඔහු පෙරදී වැරදීමකින් ගමන් කරන ලද විශාල වායු බුබුල තිබුණු උමගයි. එම උමගෙහි ඇතුළත සිටි මත්සයින් එම විශාල වායු බුබුලෙන් වාතය ලබා ගත් සැටි ඔහුට මතක් විය.

"සමහර විට මටත් පුළුවන් වෙයි ඒ වාත බුබුලෙන් වාතය ලබා ගන්න"

මෙතෙක් වේලා තමා පසුකර ආ බාධක නැවතත් තරණය කර මුහුද මතුපිට පෘෂ්ඨයට පැමිණ හුස්මක් ගැනීමට තරම් වේලාවක් ඉතිරි නැති රිකාඩෝට පැමිණි අවසන් අදහස එයයි.

ඔහු තමාගේ ශරීරය තුළ ඉතිරිව ඇති අවසන් හුස්ම පොදේ ශක්තියෙන් නැවත අනෙක් උමගෙහි ඇති විශාල වායු බුබුල අසලට ගියේය.

ඔහු දැන් සිදුකිරීමට යන කාර්ය නිශ්ඵල වුවහොත් ඔහුගේ මරණය පෙරටත් කලින් සිදුවීම ඒකාන්තය. එබැවින් ඔහු නිර්භීතව සහ අධිෂ්ඨානශීලීව වායු බුබුළ තුළට ඇතුළු විය.

වායු බුබුළට ඇතුළු වූ ඔහු තමා මෙතෙක් වෙලා දරාගෙන සිටි ආශ්වාස වාත ධාරාව ප්‍රශ්වාස කළේ ඉතා අවිනිශ්චිතතාවයකින් යුක්තවය.

ඉන්පසු නැවතත් ඔහු දිග හුස්මක් ගත් අතර එම හුස්ම ගැනීමේදී ඔහුට කිසිදු අපහසුතාවයක් ඇති නොවිණි.


නැවතත් ඔහුගේ සතුට නිම් හිම් නැති විය.

දෛවය විසින් සිදු කරන සෑම දේම සිදු කරනු ලබන්නේ අදාළ පුද්ගලයාගේ යහපතට බව එවිට රිකාඩෝට වැටහිණි.

ඔහුට මෙම වායු බුබුළ හමු නොවුනානම් ඔහු අද මෙම ගුහාව තුළම මිය යනු ඇත.

ඔහු නැවතත් ඉතා නිර්භීතව නැවත ඇලෝඩියා පාෂාණය තිබෙන ස්ථානයට ගොස් ඉක්මනින් ම පාෂාණය ද රැගෙන ගුහාවෙන් ඉවතට පැමිණියේය.

මුහුද මතුපිටට පැමිණි ඔහු තම ඔරුවට නැගී නැවතත් ගොඩබිම කරා ගමන් කළේය.



ඔහු ආපසු ගමට ගිය පසු රිකාඩෝගේ මව සහ ගම්වැසියෝ විසින් ඔහුව උණුසුම් ලෙස පිළිගත්හ. ගමේ දැනමුතු වැඩිහිටියෙකු රිකාඩෝ ගෙනා පාෂාණය පරීක්ෂා කර බලා පැවසුවේද රිකාඩෝ සිතූ දෙයමයි, ඒනම් මෙම පාෂාණයෙන් මුළු පොළවම සරුසාර කළ හැකි බවයි.ගමේ නායකයා විසින් රිකාඩෝව වීරයෙක් ලෙස නම්කල අතර රිකාඩෝගේ ප්‍රධානත්වයෙන් ගමේ තරුණයින් කණ්ඩායම ද එක්ව ඇලෝඩියා පාෂාණය කුඩු කර සාදාගත් මිශ්‍රණය පොළොවට ඉසීමෙන් අනතුරුව වගා කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී.

සති කිහිපයකට පසු
මෙතෙක් කල් නිසරු භූමියක් ලෙස පැවති සීටන් දැන් සරුසාර භූමියක් බවට පත්ව ඇත. එහි පොළොව ලොව වෙනත් ස්ථානවල පොළොවට වඩා ඉතා සරුසාර වී ඇති අතර ඕනෑම ශාකයක් කිසිදු බාධාවකින් තොරව එම සරුසාර භූමියේ වැඩී මල්ඵල ලබාදේ.මේ නිසා මෙම ගමේ ගම්වැසියන්ට නැවතත් කවමදාවත් ආහාර සොයා මුහුද යට කිමි දෙන්නට අවශ්‍ය නොවූ අතර ගමේ සියලූම දෙනා ම රිකාඩෝව වීරයෙක් ලෙස සැලකූහ.

*නිමි*

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර  මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරිය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)